# මානසික වද වේදනා

කෙනකුට ශාරීරික රෝගාබාධ මෙන්ම මානසික රෝගාබාධ ද වැළඳීමට අවකාශ තිබිය හැකිය. ශාරීරික රෝගාබාධ දෙවැදෑරුම් ය. එක් කොටසක් පිටතින් දක්නට ලැබෙන රෝගාබාධයන්ය. අනෙක් කොටස ඇතුළත හටගන්නා රෝගාබාධයන්ය. පිළිකා මධුමේහය වැනි කලාන්තරයක් තිස්සේ බලපවත්වන ඇතැම් රෝගාබාධ හේතුකොට කෙනකු මානසික වශයෙන් බිඳවැටී සමහර විට සදකාලික මානසික රෝගියකු බවට පත්වීමට වුවද අවකාශ තිබිය හැකිය.

**එඩ්වින් පතිරණ**

**බිරිඳ මුළුතැන්ගෙයි යම්කිසි කාර්යයක නිරතව සිටින අතරතුරේ දී , ඇයගේ මිතුරියන් හෝ හිතවතියන් සමග කථාබහ කරමින් මහ හඬින් සිනාසනවිට ඇතැම්විට ස්වාමි පුරුෂයා සැක පහළ කරයි. ඔවුන් එසේ සිනාසෙන්නේ තම අඩුපාඩුකම් හෝ දුර්වලකම් ගැන හෝ විවේචනය කරමින් විය හැකි යැයි අනුමාන කිරීමට හෙතෙම පෙළඹෙයි.**

තවත් පිරිමියකු ගැන සිතා බැළුවහොත් ඔහුට තම බිරිඳ කැවත් වැරදිය බීවත් වැරදිය, සිනාසුණත් වැරදිය,ඇන්දත් වැරදිය,පැළඳුවත් වැරදිය. වෙනත් පිරිමියකු සමග කථාබහ කළත් වැරදිය. අස්ථානයේ සැක පහළ කිරීමට ඔහු ඉක්මන් වෙයි.

වෙනත් බිරිඳකට තම සැමියා පිටස්තර කාන්තාවන් සමග කථාබහ කිරීම, විහිළු තහළු කිරීම, ඇයි හොඳයි කම් පැවැත්වීම රුස්සන්නේ නැත.

ඇතැම් කාන්තාවන් තම සැමියන්ගේ සේවා ස්ථාන අසල හොර රහසේ ගැවසෙමින් ඔත්තු බලන බවද අසන්නට ලැබී ඇත.

සමහරවිට තම සැමියන් සම්බන්ධයෙන් දූෂමාන ආරංචි ලැබී තිබෙනවා වීමට පුළුවන. එසේ නැත්නම් තම අභිරුචීන් සඵල කර ගැනීමට පිපාසයෙන් පෙළෙන සමහර ඊර්ෂ්‍යාකාර පුද්ගලයින්ගේ නොමනා ක්‍රියවන් වීමට ද ඉඩ ඇත. එසේ නොමැතිව පදනම් විරහිතව බිරිඳ තම සැමියාත්, සැමියා තම බිරිඳත් ගැන සැක පහළ කරන්නේ ඔවුනොවුන්ගේ සිත්සතන් තුළ පහළවන සංකාව නිසා වීමට පුළුවන. එය එක්තරා අන්දමේ මානසික රෝගයක් වශයෙන් හඳුන්වනු ලැබේ. නොගැලපෙන විවාහයක් හේතුකොට ද කෙනකු මානසික රෝගියකු බවට පත්වීමට පුළුවන. සමහර දූ දරුවන්ගේ විෂමාචාර හා නොමනා ක්‍රියාකලාපයනගේ ප්‍රතිඵලයක් වශයෙන් ද ඇතැම් මව්පියවරු මානසික රෝගීන් බවට පත්ව සිටිති.

කෙනකුට ශාරීරික රෝගාබාධ මෙන්ම මානසික රෝගාබාධ ද වැළඳීමට අවකාශ තිබිය හැකිය. ශාරීරික රෝගාබාධ දෙවැදෑරුම් ය. එක් කොටසක් පිටතින් දක්නට ලැබෙන රෝගාබාධයන්ය. අනෙක් කොටස ඇතුළත හටග්නනා රෝගාබාධයන්ය. පිළිකා මධුමේහය වැනි කලාන්තරයක් තිස්සේ බලපවත්වන ඇතැම් රෝගාබාධ හේතුකොට කෙනකු මානසික වශයෙන් බිඳවැටී සමහර විට සදකාලික මානසික රෝගියකු බවට පත්වීමට වුවද අවකාශ තිබිය හැකිය.

ඇතැම් රෝගාබාධ මතුපිටින් නොපෙනෙන්නට පුළුවන. එහෙත් මානසික රෝගාබාධ එසේ නොවේ. රෝගියාගේ හැසිරීම් රටාවේ වෙනස්කම් තුළින් ඔහුගේ ඉරියව් මගින් බොහෝ දුරට ඔහු මානසික රෝගියකු ද යන බව හඳුනාගත හැකිවෙයි.

ඇතැම් මානසික රෝගියකු බලාගත්වනම ඒ ඉරියව්වෙන් පසුවීමට පුළුවන. සමහර විට තනිවම සිනාසීමද තවත් ලක්ෂණයක් ය. එසේ නැත්නම් කල්පනාවේ නිමග්නව සිටින බවක්ද පෙන්නුම් කරනවා විය හැකිය.න තවත් මානසික රෝගියකු අගක් මුලක් නැතිව,කිසිදු පැහැදිලි තේරුමක් නැතිව, දිගින් දිගටම කථා කරනු දක්නට ලැබෙයි. එක් තරුණයෙක් ඔහුට හමුවන දන්නා හඳුනන අයගෙන් උසස් පෙළ ප්‍රශ්න පත්‍ර ඉල්ලා සිටීම පුරුද්දක් කරගෙන සිටියේය. අධ්‍යාපනය ලැබූ තවත් තරුණයකුගේ පුරුද්ද වූයේ , එකිනෙකට කිසිදු සම්බන්ධතාවයක් නොමැති මාතෘකා යටතේ කථාබහක යෙදී සිට මොහොතකින් සමුගෙන යෑම ය.

අනවශ්‍ය අවස්ථාවන්හිදී හෙතෙම අව් කණ්ණාඩි පැළඳ යන සැටි ද දක්නට ලැබී ඇත.

තිසි කල වයසේදී විවාහ ජීවිතයට ඇතුළත් වීමට අපොහොසත් වූ තරුණ තරුණියන් අතරද මානසික රෝගීන් සිටින බව අසන්නට ලැබෙයි. වැඩි වශයෙන් එය කාන්තා පක්ෂයට බලපාන බවක් ද දක්නට ලැබී ඇත. ඔවුන් තුළ විවාහක සොහොයුරු සොහොයුරියන් හා අඹු සැමියන් කෙරෙහි එක්තරා අන්දමේ ඊර්ෂ්‍යා සහගත හැඟීම් පහළවීමේ ප්‍රවණතාවක් ඇති බව ද පැවසෙයි. ඇතැම් කාන්තාවන්ගේ ඊර්ෂ්‍යා සහගත හැඟීම් මර්දනය කර ගැනීමට අපොහොසත්ව සණ්ඩුසරුවල් කරගත් අවස්ථා ගැන ද අසන්නට ලැබී ඇත.

තවත් සමහර උදවිය වැඩිවශයෙන්ම කාන්තාවන් අසල්වැසියන් අනුකරණය කරන්නට යැමෙන් එතරම්ම වැදගත් නොවන අවස්ථා පවා නිමිතිකර ණයතුරුස් වී ප්‍රියසාද ආදිය පවත්වා එම ණය මුදල් ගෙවා ගැනීමට නොහැකිව මානසික වද වේදනාවලට පත්ව සිටින බව ද දැනගන්නට ලැබුණි.

අන්‍යයන් භුක්ති විඳින නොයෙකුත් සැප සම්පත් දෙස බලා තමන්ටත් එවැනි භාග්‍යයක් නොමැති වීම ගැන සිතන්නට වීම හේතුකොට මානසික රෝගීන්ගේ තත්ත්වයට පත්වූ අපද සමාජයේ සිටින බව

අසත්‍යයක් නොවේ. කාන්තාවන් සාමාන්‍යයෙන් ජේත්තුවට අඳින්නට පළඳින්නට රුචියක් දක්වීම පොදු ලක්ෂණයක් වුවත්, අවමඟුලක් වැනි අවස්ථාවකට සහභාගිවීමේ දී පවා ලකලෑහැස්ති වීමට පැය ගණනක් ගත කිරීම එක්තරා අන්දමේ උන්මාදයක් ලෙස නොසැලකිය හැකි ද ?. කෙතරම් ඇඳුම් පැළඳුම් තිබුණ ද ඒවායින් සෑහීමට පත් නොවී කන්නෙඳිරි ගෑම ඇතැම් කාන්තාවන්ගේ සිරිත ය. එය ද කල්යෑමේ දී ඇතැමුනට සෑහෙන දුරකට බලපාන අනවශ්‍ය මානසික වද වේදනාවක් බවට පත්වේ. අන්ධානුකරණයෙන් අන්‍යයන් අනුගමනය කිරීමට යෑමෙන් ද සමහරුන් මානසික රෝගීන්ගේ තත්ත්වයට පත්වීමට මඟ පාදග්නනා බවක් ද පෙනී යයි.

මානසික වශයෙන් රෝගී තත්ත්වයට පත් වූ අවස්ථාවන්හි දී රෝගියාගේ කල්පනා ශක්තියෙහි මෙන්ම යමක් අවබෝධකර ගැනීමේ හා වටහා ගැනීමේ ශක්තියෙහි ද වෙනසක් අනිවාර්යයෙන්ම පෙන්නුම් කෙරේ. ඒ අනුව ඉහත සඳහන් කළ පරිදි ඔහුගේ හෝ ඇයගේ හැසිරීම් රටාවෙහි ද සාමාන්‍ය හැසිරීම් රටාවට වඩා වෙනසක් දක්නට ලැබෙයි.

ඒ අතර මානසික රෝගියකු වෙතින්, අඛණ්ඩ උදාසීනත්වයක් සේම දෙමිතස් සහගත බවක් ද විද්‍යමාන වෙයි. එමෙන්ම ඔහු තුළින් පදනම් රහිත බියක් මෙන්ම සාංකාවක් ද විදහා දක්වෙයි. එදිනෙද සුපුරුදු වැඩ කටයුතුවල නිරතවීමේ අපහසුතාවයක් ඔහුට දැනෙයි. ඔහුගේ කෑම බීම හා නිදා ගැනීම ඇතුළු සුපුරුදු දින චරියාවේ කැපී පෙනෙන වෙනස්කම් දක්නට ලැබෙයි. කෙනෙකුගෙන් පමණ ඉක්මවා සතුටුවෙන උද්දමයට පත්වෙන බවක් දක්නට ලැබෙන අතර තව කෙනකු මානසික අසහනය හේතුකොට මත්ද්‍රව්‍ය භාවිතයට ද ඇබ්බැහි වෙයි. එවැනි ශෝචනීය තත්ත්වයකට ගොදුරු වූ අයෙකු එයින් ගොඩ ගැනීම නම් එතරම් ලෙහෙසි පහසු කාර්යයක් නොවනු ඇත. ❑

**මූලාංගල රිචර්ඩ් [illegible]**